# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2397/27 - 2024 අගෝස්තු මස 13 වැනි අඟහරුවාදා - 2024.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

**රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2024 අගෝස්තු මස 28 දින මධ්‍යාහ්න 12.00 දක්වා මවිසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
සභාපති,
රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ
කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A - G 42479— 09 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1949 නොවැම්බර් මස 25 වැනි දින අංක 10047 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද අවසන් වරට 2021 මාර්තු මස 05 වැනි දින අංක 2217/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලෙඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

**කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය**

| *විස්තරය* | *ගෙවීම* |
|---|---|
| දෛනික අවම ගෙවීම<br>(මෙම ප්‍රමාණය තුළ දෛනික අයවැය සහන දීමනාව ද ඇතුළත් වන අතර සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගෙවීම සඳහා මෙම ප්‍රමාණය අදාළ කරගත යුතු වේ.) | රු. 1,350.00 |
| ඵලදායිතාවය මත පදනම් වූ දිරි දීමනාව | රු. 350.00 |
| දෛනික සම්පූර්ණ ගෙවීම | රු. 1,700.00 |

EOG 08 - 0177/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2024 අගෝස්තු මස 28 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා මවිසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
සභාපති,
තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1945 ජූලි මස 31 වැනි දින අංක 9441 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2021 මාර්තු මස 05 වැනි දින අංක 2217/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

**කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය**

| *විස්තරය* | *ගෙවීම* |
|---|---|
| දෛනික අවම ගෙවීම<br>(මෙම ප්‍රමාණය තුළ දෛනික අයවැය සහන දීමනාව ද ඇතුළත් වන අතර සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගෙවීම සඳහා මෙම ප්‍රමාණය අදාළ කරගත යුතු වේ.) | රු. 1,350.00 |
| ඵලදායිතාවය මත පදනම් වූ දිරි දීමනාව | රු. 350.00 |
| දෛනික සම්පූර්ණ ගෙවීම | රු. 1,700.00 |

EOG 08 - 0177/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.